# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2023.03.14 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2023 පෙබරවාරි

### 2023 පෙබරවාරි මාසයේදී, නිෂ්පාදන හා සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුබෑමක් පෙන්නුම් කරන ලදී.

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි අඛණ්ඩ පසුබෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 පෙබරවාරි මාසයේ දී 42.3ක අගයක් වාර්තා කරන ලදී.** මෙම පසුබෑම කෙරෙහි නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් පහත වැටීම හේතු විය.

නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීම කෙරෙහි ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු ඉල්ලුම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව පහත වැටීම මෙලෙස ඉල්ලුම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වු බව ආහාර හා පාන නිෂ්පාදන අංශය නියෝජනය කරන බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. එසේ වුවද, අප්‍රේල් උත්සව සමය ඉලක්ක කරගනිමින් ඉදිරි මාසයේ දී ඉල්ලුම මෙම මාසයට සාපේක්ෂව ඉහල යනු ඇතැයි ඔවුහු අපේක්ෂා කරති. තවද, මෑතකදී විදුලි ගාස්තු ඉහළ නැංවීම ඔවුන්ගේ පිරිවැය ව්‍යුහයට අහිතකර ලෙස බලපා ඇති බව බොහෝ නිෂ්පාදකයින් සඳහන් කරන ලදී. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිල දී ගැනුම් ද පහත වැටුණි. අඩු ඉල්ලුම් තත්ත්වයන් සහ ගෝලීය භාණ්ඩ මිල, නැව් ගාස්තු සහ විනිමය අනුපාතවල පහත වැටීමේ ප්‍රවණතාවන් සැලකිල්ලට ගනිමින් නිෂ්පාදකයින් අමු ද්‍රව්‍ය තොග අවම මට්ටමක පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයේ මට්ටමේ ම නොවෙනස්ව පැවතුනි.

| විචලයය | ජන. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **40.8** | **42.3** | **+** | අඩු වේගයකින් පහළ යෑමක් |
| **<u>උපදර්ශක</u>** | | | | |
| නව ඇණවුම් | 38.0 | 41.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 37.5 | 40.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 41.0 | 40.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 35.5 | 43.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 55.0 | 50.0 | - | නොවෙනස්ව පවතී |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


වැය කළ හැකි අදායම පහත වැටීම හමුවේ වුවද, එළඹෙන උත්සව සමය ඉලක්ක කරමින් ඉල්ලුම සහ නිෂ්පාදනය වැඩි වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**42.3**

**2023 පෙබරවාරි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ජනවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.9කින් ඉහළ යමින් 2023 පෙබරවාරි මාසයේ දී කඩඉම් මට්ටම වන 50.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පසුගිය මාසයට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය චීනය සහ රුසියාවේ වැඩි වේගයකින් ද ඉන්දියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ සිංගප්පූරුව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 මාර්තු 14 වන දිනට*

---

*[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයේ පසුබෑමක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 පෙබරවාරි මාසයේ දී 48.7ක දර්ශක අගයක් දක්වා පහත වැටුණි.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ නිමකිරීමට නියමිත කාර්යයන් පහත වැටීම හේතු විය.

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන, රක්ෂණ සහ තැපැල් හා කුරියර් යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑමත් සමඟ, 2023 ජනවාරි මාසයට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ දී නව ව්‍යාපාර පහත වැටුණි.

මාස හයක අඛණ්ඩ වර්ධනයකින් පසු සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් 2023 පෙබරවාරි මාසයේ දී පහත වැටුණි. ඒ අනුව, පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම පහළ යෑම මධ්‍යයේ තොග හා සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් පහළ ගියේය. තවද, බහාලුම් පරිමාවල පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන උප අංශය අඛණ්ඩව පහළ ගිය අතර, සෞඛ්‍ය, රක්ෂණ සහ තැපැල් හා කුරියර් යන උප අංශ ද පෙබරවාරි මාසය තුළ පහළ යෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, තැන්පතු ඉහළ යෑමත් සමඟ මූල්‍ය අංශය පෙබරවාරි මාසයේ දී අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය.

සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් හේතුවෙන් පෙබරවාරි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගිය අතර, නව ව්‍යාපාරවල පහළ යෑම හා සමගාමීව නිමකිරීමට නියමිත කාර්යයන්ද පහළ ගියේය.

| විචල්‍යය | 2023 ජන. | 2023 පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **50.2** | **48.7** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 56.0 | 49.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 51.5 | 45.0 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 39.4 | 42.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.1 | 43.6 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 60.1 | 63.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්, එළඹෙන උත්සව සමය, සංචාරක පැමිණීම් ඉහළ යෑම සහ ආර්ථිකය බොහෝ දුරට ස්ථාවර වීම පිළිබඳ අපේක්ෂාවන් මධ්‍යයේ වර්ධනය විය. කෙසේ වෙතත්, ඉහළ බදු සහ විදුලි ගාස්තු හේතුවෙන් ලාබ අඩු වීම සහ වැය කළ හැකි ආදායම අඩු වීම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම පහළ යෑම මගින් ඇතිවන ගැටළු සහගත තත්ත්වය පිළිබඳව සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය** **48.7**

**2023 පෙබරවාරි**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 ජනවාරි මාසයේ පැවති 50.0 සිට 2023 පෙබරවාරි මාසයේ දී 52.6 දක්වා ඉහළ ගියේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 මාර්තු 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.